Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව

## තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවීම

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති බෙලිඅත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුර | තනතුරු සංඛ්‍යාව | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | පුස්තකාල සහායක III වන ශ්‍රේණිය | 01 | PL1-2016 24250-10×250-10×270-10×300-12×330-36410 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබිය යුතුය. |

02. බඳවා ගැනීමේ කොන්දේසි :

1. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
2. අයදුම්කරුවන් මනා මානසික හා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
3. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 ක් බෙලිඅත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි කරුවකු විය යුතුය.
4. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් දකුණු පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ)
5. බඳවා ගැනීමේ පටිපාටිය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයකට යොමු කරන අතර, එහිදී ලබා ගන්නා ඉහලම ලකුණු අනුව සුදුස්සන් තෝරා ගැනේ.
6. දැනටමත් බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ එම තනතුරුවල අනියම්, ආදේශක, කොන්ත්‍රාත් හෝ දෛනික පදනම යටතේ සේවයේ නියුක්ත වූවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලබන අතර, ඔවුන් ආයතන ප්‍රධානියා මගින් තම අයදුම් පත ඉදිරිපත් කල යුතුය.
7. තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීතිවලට ද, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ රෙගුලාසි වලටද, බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව පනවනු ලැබ ඇති හා වරින් වර පනවනු ලබන නීතිරීතිවලටද යටත් විය යුතුය.
8. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සපුරා තිබිය යුතුය.

03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

I. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.
II. වැන්දඹු/ පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.
III. බඳවා ගනු ලබන අය වසර 03 ක පරිවාස කාලයකට යටත්ය. එම කාලය තුලදී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේ සේවයේ ස්ථිර කරනු ලැබේ.
IV. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය අනුව අවශ්‍ය භාෂා ප්‍රවීනතාව ලබා ගත යුතුය.
V. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

04. තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්:

| | | | |
|---|---|---|---|
| අධ්‍යාපන සුදුසුකම් | උපරිම ලකුණු ප්‍රමාණය | = | 30 |
| අමතර සුදුසුකම් | උපරිම ලකුණු ප්‍රමාණය | = | 10 |
| පළපුරුද්ද | උපරිම ලකුණු ප්‍රමාණය | = | 10 |
| සභා බල ප්‍රදේශයේ පදිංචිය (වසරකට ලකුණු 5 බැගින්) | උපරිම ලකුණු ප්‍රමාණය | = | 45 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුශලතාවය | උපරිම ලකුණු ප්‍රමාණය | = | 05 |
| | එකතුව | | 100 |

(තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය 50%)

05. අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කළ යුතුය ෑ
උප්පැන්න සහතිකය;
ජාතික හැඳුනුම්පත;
අධ්‍යාපන සහතික, ඉහලම අධ්‍යාපන සුදුසුකම් දැක්වෙන සහතික;
තම පදිංචිය සහතික කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිත ග්‍රාම සේවා සහතිකය;
මෑතකදී ලබා ගන්නා ලද චරිත සහතික දෙකක්;
සේවා පළපුරුද්ද පිළිබඳ සහතික;
වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික;
(මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්පත් පමණක් පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.)

06. අයදුම්පත් ඉදිරිපත් කරන ආකාරය ෑ

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුව A4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කරන ලද අයදුම්පත් 2018.11.12 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "සභාපති - බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව - බෙලිඅත්ත" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් කරන තනතුර අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුරේ දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලතල බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ සභාපති සතුය.

සිරිල් මුණසිංහ,
සභාපති,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

2018 ක් වූ ඔක්තෝබර් මස 12 වැනි දින,
බෙලිඅත්ත,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව

.................................................................. තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම් පත්‍රය.

01. මුලකුරු සමඟ නම :..............................................
02. මුලකුරුවලින් හැඳින්වෙන නම :..............................................
03. ස්ථිර ලිපිනය :..............................................
04. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :..............................................
05. ජාතික හැඳුනුම්පත් අංකය :..............................................

06. උපන් දිනය : වර්ෂය:............... මාසය :............... දිනය:..................

07. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු:............... මාස :............... දින :..................

08. විවාහක/ අවිවාහක බව :..............................................

09. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? යන වග :..............................................

10. ඔබ සාපරාධී වරදක් සම්බන්ධව උසාවියකින් වරදකරුවකු කර තිබේ ද?:.............................................. :

11. අධ්‍යාපන සුදුසුකම්

| අ.පො.ස (සා/පෙ.) | අ.පො.ස. (උ/පෙ.) |
|---|---|
| .............................................. | .............................................. |
| .............................................. | .............................................. |
| .............................................. | .............................................. |
| .............................................. | .............................................. |
| .............................................. | |
| .............................................. | |
| .............................................. | |
| .............................................. | |

12. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :..............................................
:

13. ඔබ දැනට බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ හෝ දකුණු පළාත් රාජ්‍ය සේවයේ නියුතු නම්:

1. දැනට දරන තනතුර:..............................................
2. එම තනතුරට පත්වූ දිනය:..............................................
3. එම පත්වීමේ ස්වභාවය :..............................................
(ස්ථිර/ ආදේශක/ අනියම්/ කොන්ත්‍රාත්/ දෛනික පදනම ද යන වග)

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බව ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද දනිමි.

දිනය :........................ ..............................................;
අයදුම්කරුගේ අත්සන

*ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ආයතනයේ .............................................. ලෙස සේවය කරනු ලබන ..............................................මයා/මිය/මෙය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු කාර්යාලයීය ලිපි ලේඛන අනුව නිවැරදි වේ. මෙම තනතුරට තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක. අයදුම් පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

ආයතන ප්‍රධානියාගේ අත්සන :........................;
නම :........................
තනතුර :........................ :

දිනය :........................